# රැකවල් දේව දූතයෝ
## අනුස්මරණය

## පළමුවන දේව ප්‍රකාශනය නික්මයාම 23: 20–23

*නික්මයාම පොතෙන් උපුටා ගත් කොටසකි.*

"නුඹලා ආරක්ෂා කිරීමට නුඹලාට පෙරටුවෙන් මම දූතයෙකු යවන්නෙමි."

"බලන්න, මාර්ගයේ දී නුඹලා ආරක්ෂා කිරීමටත්, මා සූදානම් කළ ස්ථානයට නුඹලා ගෙන ඒමටත් නුඹලාට පෙරටුවෙන් මම දූතයෙකු යවන්නෙමි. ඔහුට ගෞරව කරන්න, ඔහුගේ හඬට කීකරු වන්න. ඔහුට විරුද්ධ ව කැරලි නොගසන්න. මාගේ නාමයෙන් ඔහු ක්‍රියා කරන බැවින් ඔහු නුඹලාගේ වැරදි කමා නොකරන්නේ ය. එහෙත්, නුඹලා ඔහුගේ හඬට කීකරු වී මා කියන සියල්ල කරන්නහු නම් මම නුඹලාගේ සතුරන්ට සතුරෙක් ද නුඹේ විරුද්ධවාදීන්ට විරුද්ධවාදියෙක් ද වන්නෙමි. මාගේ දූතයා නුඹලාට පෙරටුව ගොස් අමෝරිවරුන්, හිත්තීවරුන්, පෙරිස්සිවරුන්, කානානිවරුන්, හිව්වරුන් හා ජෙබුසිවරුන් වෙතට නුඹලා පමුණුවන්නේ ය. මම ද ඔවුන් වනසාලමි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 91: 1–6, 10–11

පිළිතුර : සමිඳාණෝ අප රක්නා ලෙස තම දූතයන්ට අණ කරන සේක.

ගීය : පරමෝත්තමයාණන්ගේ රැකවරණෙහි වසන තැනැත්තේ,
සර්ව බලැති දෙවිඳුන්ගේ සරණෙහි සුරැකි වන්නේ ය.
ඔහු සමිඳුන්ට මෙසේ පවසයි: "එතුමාණෝ මාගේ රැකවරණය ය:
මාගේ බලකොටුව ය: මාගේ දෙවිඳාණෝ ය.
මම එතුමන් කෙරෙහි මාගේ විශ්වාසය තබන්නෙමි."

එතුමාණෝ, කපටින්ගේ මලපත්වලින් ද / බියකරු ලෙඩරෝගවලින් ද අප රැකගන්න සේක.
සිය පියාපත්වලින් ඔබ ආවරණය කරන සේක:
ඒවා ඔබේ රැකවරණ වන්නේ ය.
එතුමන්ගේ විශ්වාසවන්තකම ඔබට රැකවරණය ද පලිහ ද වන්නේ ය.

රෑ කාලයේ ඇති වන බියට වත්,
දවලේ ඒ පහරින් වන උවදුරට වත් ඔබ බිය නොවන්නෙහි ය.
අඳුරේ සැරිසරන වසංගතයට වත්,
මද්දහනේ වනසාලන පීඩාවට වත්,
ඔබ බිය නොවන්නෙහි ය.

එවිට ඔබට කිසි උවදුරක් නොවන්නේ ය:
ඔබේ නිවෙසට කිසියම් වසංගතයක් ළං නොවන්නේ ය.
ඔබ ගන්න සෑම පියවරක දී ඔබ රක්නා පිණිස,
එතුමාණෝ සිය දූතයන්ට අණ දෙන සේක.

## සුපුවත් ජය නද ගීතාවලිය 103: 21

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ සේනා සියල්ලෙනි,
එතුමන්ගේ කැමැත්ත ඉටු කරන්න.
ආලේලූයා!

## සුවිශේෂය

මතෙව් 18: 1–5

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔවුන්ගේ දේව දූතයෝ ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ ඉදිරියෙහි නිරතුරු සිටිති."

ශ්‍රාවකයෝ ජේසුස් වහන්සේ වෙතට අවුත්, "ස්වර්ග රාජ්‍යයෙහි ඉතා ම උතුම් වන්නේ කවරෙක් දැ"යි ඇසූහ. එවිට උන් වහන්සේ කුඩා දරුවෙකු තමන් වෙතට කැඳවා ඔවුන් මැද සිටුවා මෙසේ වදාළ සේක: "සැබැවින් ම මම ඔබට කියමි, ඔබ වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුවොත්, කිසි සේත් ස්වර්ග රාජ්‍යයට ඇතුළු නො වන්නහු ය. එබැවින් මේ කුඩා දරුවා මෙන් යටහත් වන යමෙක් ඇද්ද, ස්වර්ග රාජ්‍යයෙහි ඉතා ම උතුම් වන්නේ ඔහු ය. තවද, යමෙක් මාගේ නාමයෙන් මෙවැනි කුඩා දරුවෙකු පිළිගන්නේ ද ඔහු මා පිළිගන්නේ ය."

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*